## Abstract 41

# කොරියානු ජන ජීවිතය, බුදුදහම සහ රාජ්‍ය තන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයනයක්

**ඩී. ජී. ඩී. පී. එස්. ප්‍රේමරත්න,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*devindaprabhathsri@gmail.com*

මහායාන බුදුදහම ක්‍රියාත්මක වන නැගෙනහිර ආසියාතික බෞද්ධ රටක් ලෙස **කොරියාව** හැඳින්විය හැකි ය. කොරියාවට බුදුසමය ලැබී ඇත්තේ චීනයෙන් බව පිළිගත් අදහස යි. ඒ අනුව ක්‍රි:ව 372 දී පමණ කොරියාවට බුදුදහමේ අභාසය ලැබී ඇති අතර එම අවධිය වන විට කොරියාව අභ්‍යන්තර රාජ්‍ය තුනකින් සමන්විතව පැවති බව ඓතිහාසික තොරතුරුවලින් සනාථ වේ. **කොගිරියෝ, පෙක්චේ** හා **ශිල්ලා** යනු එම ප්‍රාන්ත රාජ්‍යයන් ය. මින් පළමුව බුදුදහමේ ආභාසය කොගිරියෝවට ලැබී ඇති බව සඳහන් වේ. පසුකාලීනව කොරියානු බුදුසමය මහායාන සම්ප්‍රදායයේ ආභාසය සහිතව ජන ජීවිතයට සමීපව ඉතා දියුණු තත්ත්වයකින් ක්‍රියාත්මකව ඇත. බුදුදහමේ ආභාසයෙන් ඉතා දියුණු සංස්කෘතියකට උරුමකම් කී කොරියානු බෞද්ධයෝ සදාචාර සම්පන්න ප්‍රජාවක් බවට ද පත් වූහ. එහි දී රාජ්‍යයේ අනුග්‍රහය බුදුසමයට ඉතා ඉහළින් ම ලැබුණු අතර එනිසා ම ජනතාව විසින් ද බුදුසමය ඉතා ශීඝ්‍රයෙන් වැළඳ ගන්නා ලදී. කොරියාවෙහි සමාජ, ආර්ථික හා දේශපාලන යන සෑම අංශයක් ම පාහේ බෞද්ධ මූලධර්මයන්ට අනුකූලව ගොඩ නැගෙන්නට විය. මෙම තත්ත්වයට විශේෂයෙන් ම බලපෑ සාධකය වන්නේ බුදුසමය කොරියාවට දායාද වන යුගයේ හා ඊට පසුකාලීනව රාජ්‍ය මෙහෙය වන ලද පාලකයින්ගේ ක්‍රියා පිළිවෙත යි. ඔවුහු ස්වකීය රාජ්‍යය පරිපාලනය බෞද්ධ මූලධර්මයන්ට අනුකූල වන පරිදි සකස් කර ගත්හ. මේ අනුව කොරියානු පාලකයින්ගේ සුබවාදී ක්‍රියාකලාපය එරට ජන ජීවිතය බුදුසමයට අනුගතව සංවිධානය වීම විෂයයෙහි බලපෑ බව කිව හැකි ය. එබැවින් මෙම පර්යේෂණයේ දී අවධානය යොමු වන්නේ කොරියානු ජන ජීවිතයට බුදුසමය සමීප කිරීමෙහි ලා එරට රාජ්‍ය තන්ත්‍රයෙහි ක්‍රියාකලාපය ඉවහල් වූ ආකාරය පිළිබඳ විමර්ශනය කිරීම විෂයයෙහි ය. ආගම හා රාජ්‍යය අතර සුසංයෝගීත්වයක් පැවතීම රටක සංවර්ධනය කෙරෙහි ඉවහල් වන ආකාරය වටහා ගැනීමට මෙය වැදගත් සාධකයක් වනු ඇත.

**ප්‍රමුඛ පද :** කොරියාව, ජන ජීවිතය, පාලකයා, බුදුදහම, සංවර්ධනය